**කම්කරු දෙපාර්තමේන්තුවේ II ශ්‍රේණියේ කම්කරු නිලධාරීන් සාමාන්‍ය කාර්ය සාධනය යටතේ I ශ්‍රේණියට උසස් කිරීම**

01. 2013.09.26 දින රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද ක්ෂේත්‍රගත / කාර්යාලගත බණ්ඩ 02 සේවා ගණය සඳහා වන බඳවා ගැනීමේ පරිපාටියේ දැක්වෙන විධි විධාන පරිදි 2020.02.03 / 2020.07.01 දින වන විට පහත සඳහන් සුදුසුකම් සපුරා ඇති කම්කරු නිලධාරී II ශ්‍රේණියේ නිලධාරීන් I ශ්‍රේණියට උසස් කිරීම සඳහා අයදුම්පත්‍ර කැඳවනු ලැබේ.

02. I ශ්‍රේණියට උසස් කිරීම සඳහා සපුරාලිය යුතු සුදුසුකම් හා උසස් කිරීමේ ක්‍රමය

   i. පත්වීම ස්ථිර කර තිබීම.
   ii. සේවා ගණයේ II ශ්‍රේණියේ අවම වශයෙන් වසර දහය (10) ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා වැටුප් වර්ධක දහය (10) ක් උපයා ගෙන තිබීම.
   iii. අනුමත කාර්යසාධන ඇගයීම් පරිපාටිය අනුව උසස් කිරීමේ දිනට පෙරාතුව වූ වසර දහය (10)ක් තුල සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.
   iv. උසස් කිරීමේ දිනට පූර්වාසන්නතම වසර පහ (05) තුල සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.
   v. අදාළ මට්ටමේ අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාව ලබාගෙන තිබීම. (රා.ප.ච. 01/2014 (VIII) හි විධිවිධාන අනුව කටයුතු කරනු ලැබේ.)
   vi. අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය නියමිත දිනට සමත් වී තිබීම.

ඉහත සියලුම සුදුසුකම් සම්පූර්ණ කරන ලද නිලධාරීන්ගේ සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව සුදුසුකම් ලබන දින සිට ක්‍රියාත්මක වන පරිදි I ශ්‍රේණියට උසස් කිරීම සිදු කරනු ලැබේ.

03. සියලුම සුදුසුකම් සම්පූර්ණ කර ඇති නිලධාරීන් මේ සමඟ වන ආකෘතිය අනුව සම්පූර්ණ කරන ලද අයදුම්පත ආයතන ප්‍රධානී මඟින් 2020.07.15 දිනට පෙර ලැබෙන සේ එවිය යුතුය.

ඉල්ලුම්පත www.labourdept.gov.lk ඔස්සේ ලබා ගත හැකිය.